# සුවිශේෂක සාන්ත මතෙව් අපෝස්තුළු තුමා
## මංගලයය

## පළමුවන දේව ප්‍රකාශනය එපේසි 4: 1–7, 11–13

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"ක්‍රිස්තුස් වහන්සේ සමහරුන් අපෝස්තුළුවරුන් වශයෙන් ද සමහරුන් ධර්මදේශකයන් වශයෙන් ද පත් කළ සේක."

එබැවින්, දෙවියන් වහන්සේගෙන් ඔබ ලත් කැඳවීමට ඔබින ලෙස හැසිරෙන මෙන් සමිඳාණන් වහන්සේ උදෙසා හිරකාරයකු වන මම ඔබෙන් උදෙක් ම ඉල්ලමි. සැම විට ම නිහතමානී ව විනීත ව, ඉවසිලිවන්ත ව සිටින්න: ප්‍රේමයෙන් එකිනෙකා සමඟ පැහී සිටින්න: ආත්මයාණන් වහන්සේගෙන් වන එක්සත්කම, සමගිකමේ බැම්මෙන් පවත්වාගන්නට උත්සාහ කරන්න. ඔබ කැඳවනු ලැබූ කල එක ම බලාපොරොත්තුවකට කැඳවනු ලැබූ ලෙස, ඇත්තේ එක ම ශරීරයත්, එක ම ආත්මයාණන් වහන්සේත් ය: එක ම සමිඳාණන් වහන්සේත්, එක ම ඇදහිල්ලත්, එක ම බව්තීස්ම–ස්නාපනයත් ය: සියල්ලන්ට ඉහළින් සිටින, සියල්ලන් තුළින් ක්‍රියා කරන, සියල්ලන් තුළ වැඩවසන එක ම දෙව් පියාණන් වහන්සේත් ය. එහෙත් ක්‍රිස්තුන් වහන්සේ සිය දීමනාවෙ ප්‍රමාණය අනුව අප එකිනෙකාට දේව වරප්‍රසාදය ප්‍රදානය කර ඇත. මේ ක්‍රිස්තුන් වහන්සේ, සමහරුන් ප්‍රේරිතයන් ද සමහරුන් දිවැසිවරුන් ද සමහරුන් ධර්ම දේශකයන් ද සමහරුන් සභා පාලකයන් ද සමහරුන් ගුරුවරුන් ද වශයෙන් පත් කළ සේක. එසේ කලේ දෙවියන් වහන්සේගේ සෙනග දේව සේවය සඳහා සම්පූර්ණයෙන් පුහුණු කිරීමටත්, ක්‍රිස්තු ශරීරය වර්ධනය කිරීමටත් ය. මේ ආකාරයෙන් ඇදහිල්ලේ ද දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් දැනගැන්මේ ද එකමුතුකමටත්, ක්‍රිස්තුස් වහන්සේගේ පරිණතභාවයෙ වන පරිපූර්ණ පෞරෂත්වයටත් අපි පත් වන්නෙමු.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 19: 1–3

පිළිතුර : සමිඳුනි, ඔබේ තිර පෙම නිසා අප ගැළෙව්ව මැනව.

ගීය : අහස් තලය දෙවි මහිමය ප්‍රකාශ කරන්නේ ය:
ගුවන් තලය එතුමන්ගේ අත්කම් විදහා පාන්නේ ය.

එක දිනක් තව දිනකට මෙපුවත කියන්නේ ය:
එක් රැයක් තව රැයකට එය ම පවසන්නේ ය.

කතාවක් වදනක්, කිසියම් හඬක් ඇසෙන්නේ නැති වුව ද
ඒ පණිවුඩය ලොව පුරා පැතිරී යන්නේ ය.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
ඔබ ලෝකාග්‍ර ස්වාමීන් බව ප්‍රකාශ කරමු.
ප්‍රතාපවත් අපෝස්තුළු පිරිස ඔබගේ මහිමය වර්ණනා කරති.
ආලේලූයා!

## සුවිශේෂය

මතෙව් 9: 9–13

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ජේසුස් වහන්සේ 'මා අනුව එන්නැ' යි ඔහුට වදාළ සේක."

ජේසුස් වහන්සේ එතැනින් යද්දී රේගු පොළේ හුන් මතෙව් නම් මිනිසෙකු දැක, "මා අනුව එන්නැ" යි ඔහුට වදාළ සේක. ඔහු නැඟිට උන් වහන්සේ අනුව ගියේ ය.

තවද, ජේසුස් වහන්සේ ඔහුගේ නිවසෙහි වැඩහුන් කල, බොහෝ අයකැමියෝ ද පව්කාරයෝ ද අවුත් උන් වහන්සේ සහ ශ්‍රාවකයන් සමග හිඳගත්හ. පරිසිවරු ඒ දැක, "ඔබේ ඇදුරු තුමා අයකැමියන් ද පව්කාරයන් ද සමග කෑම කන්නේ මන්දැ"යි උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් ඇසූ හ. උන් වහන්සේ ඒ අසා ඔවුන්ට කතා කොට, "රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදෙකුගෙන් වැඩක් නැත. 'මම යාග පූජාවට නොව, දයාවට කැමැත්තෙමි'යි යන කීමේ අර්ථය ඔබ ගොස් තේරුම් ගන්න. මා ආයේ දමිටුන් නොව පව්ටුන් කැඳවීමට ය"යි වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*